# 3 ශ්‍රේණිය සිංහල


# පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු

# 10 ඒකකය - 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1




# පිංපි බරස් බරස් බරස්

විවේක කාලය ආවා. කෑම කාලා ඉවර වෙලා යාළුවෝ පිට්ටනියට එකතු වුණේ සෙල්ලම් කරන්න.

"ඊයෙ මනුක සීයා කෙනෙක් වෙලා" සහන් කිවුවෙ හැමෝටම ඇහෙන්න.

"සීයා කෙනෙක්? ඇයි දත් හැලුණා ද? ඒත් කොණ්ඩෙ නම් සුදු වෙලා නෑ" කවීශා කිවුවා.

"නෑ, නෑ, මනුකලාගේ ගෙදරට නෑයො ඇවිත්. මනුක ඊයේ අලුත් සෙල්ලමක් ඉගෙන ගෙන."

"අලුත් සෙල්ලමක්! අනේ අපිටත් කියලා දෙන්න කෝ"

පවනි කිවුවා.

"ඒකේ නම පොල් කැඩීම."

"මමත් ඒ සෙල්ලම දන්නවා" පවනි කිවුවේ ආඩම්බරෙන්. "එහෙනම් හැමෝට ම කියලා දෙමු" මනුක කිවුවා.

මනුක සහ පවනි යහළුවන්ට පොල් කැඩීමේ ක්‍රීඩාව කරන හැටි කියලා දුන්නා.

"මම මුලින් ම සීයා වෙන්නම්" පවනි කිවුවා.

"ඒක හොඳයි" කිවුවෙ සහන්.

"එන්න අපි පොල් ගහ හදමු" මනුක යාළුවන්ට කතා කළා.

හැමෝම තමන්ගෙ අත් මිට මොළවා එක උඩ එක තබා පොල් ගහ හැදුවා.



යාළුවෝ : සීයෙ, සීයෙ පොල් ගෙඩියක් කඩා ගන්න ද?

පවනි : එපා... එපා...

යාළුවෝ : නැට්ට නං කැරකෙවුවා.

පවනි : හා එහෙනම් එකක් කඩා ගන්න.

යාළුවෝ : දඩිං... බිඩිං... ඩෝං...

යාළුවෝ පොල් ගෙඩි ඔක්කොම කඩන ආකාරයට ශබ්ද කරමින් අත් ඉවතට ගත්තා.

යාළුවෝ : සීයේ, සීයේ, පොල් ලෙලි ගහන්න ද?

පවනි : එපා... එපා...

යාළුවෝ : පොඩ්ඩක් ලෙලි ගැහුවා.

පවනි : හා එහෙනම් ඔක්කොම ලෙලි ගහන්න.

යාළුවෝ පොල් ලෙලි ගහන ආකාරය පෙන්නුවා.





යාළුවෝ : සීයේ, සීයේ පොල් බිඳින්න ද?

පවනි : එපා... එපා...

යාළුවෝ : පොඩ්ඩක් බින්දා.

පවනි : හා එහෙනම් ඔක්කොම බිඳින්න.

යාළුවෝ පොල් බිඳින ආකාරය පෙන්නුවා.

| | | |
|---|---|---|
| යාළුවෝ | : | සීයේ සීයේ පොල් වතුර බොන්න ද? |
| පවනි | : | එපා... එපා... |
| යාළුවෝ | : | පොඩ්ඩක් බිවුවා. |
| පවනි | : | හා එහෙනම් ඔක්කොම බොන්න. |

යාළුවෝ වතුර බොනවා වාගේ පෙන්නුවා.

| | | |
|---|---|---|
| යාළුවෝ | : | සීයේ සීයේ පොල් ගාන්න ද? |
| පවනි | : | එපා... එපා... |
| යාළුවෝ | : | පොඩ්ඩක් ගෑවා. |
| පවනි | : | හා එහෙනම් ඔක්කොම ගාන්න. |
| යාළුවෝ | : | ජිංජි බරස් බරස් බරස්. |

යාළුවෝ දණහිස නවා අත් දෙක එකතු කර පොල් ගාන ආකාරය රඟපෑවා.



යාළුවෝ : සීයේ සීයේ පොල් මිරිකන්න ද?

පවනි : එපා එපා.

යාළුවෝ : පොඩ්ඩක් මිරිකුවා.

පවනි : හා එහෙනම් ඔක්කොම මිරිකන්න.

යාළුවෝ : මිටි කිරි කිරි දිය කිරි කිරි
ඉඳා කපුටො පොල් කුඩු.

යාළුවෝ පොල් මිරිකා කුඩු ඉවතට විසි කරන ආකාරය පෙන්නුවා.

පවනි : මම එහෙනම් නාගෙන එන්නම්.

යාළුවෝ : හා හොඳයි සීයේ.

පවනි ටික දුරක් ගොස් ආපසු යහළුවන් වෙත ආවා.

පවනි : කෝ පොල් කිරි ටික?

යාළුවෝ : උඩහ ගෙදර බල්ලා බීවා.

පවනි : උඩහ ගෙදර බල්ලා කෝ ?

යාළුවෝ : ළිඳට පැන්නා.

පවනි : ළිඳ කෝ?

යාළුවෝ : ගොඩ කළා.

පවනි : ගොඩ කෝ?

යාළුවෝ : තම්පලා හිටෙවුවා.

පවනි : තම්පලා කෝ?

යාළුවෝ : රජ්ජුරුවන්ගේ ගොනා උඩිං උඩිං කෑවා
මගේ ගොනා යටිං යටිං කෑවා.

පවනි : තම්පලා කාපු හොම්බ කෝ?

යාළුවෝ : මේ තියෙන්නේ.

යාළුවෝ තම තමාගේ නිකට පෙන්වා දුවන්නට පටන් ගත්තා. පවනි

දුවලා ගිහින් එක් කෙනෙක් අල්ලා ගත්තා.

පවනි : ඇල්ලුවා... ඇල්ලුවා... දැන් රවිඳු තමයි සීයා.

ඔක්කොම ආපහු සෙල්ලම පටන් ගත්තා. සීනුව නාද වුණා.

"එන්න එන්න දැන් ඉක්මනට පන්තියට යමු."

යාළුවෝ පන්තියට දිවුවා.

"මමත් දන්නවා සෙල්ලමක්. ඉදිකටු භාරනවා කියලයි ඒකට කියන්නේ." සහන් කිවුවා.

"අනේ ඇත්ත ද? අපි හෙට ඒ සෙල්ලම කරමු." පවනි එහෙම කියද්දී ගුරුතුමා පන්තියට ආවා.

"ආයුබෝවන් ළමයි. මොනවා ගැන ද මේ කතාව?" ගුරුතුමා ඇහුවා.

"ආයුබෝවන් සර්, අපි අද පොල් කැඩුවා." කවීශා හයියෙන් කිවුවා.

"පොල් කැඩුවා?" ගුරුතුමා ළමයි දිහා බැලුවෙ පුදුමයෙන්.

"සර්, ඒක සෙල්ලමක්. මනුකයි පවනියි තමයි අපිට කියලා දුන්නේ." සහන් උත්තර දුන්නා.

"ආ... ඔව්. පොල් කැඩීම කියන්නේ අපේ ජන ක්‍රීඩාවක්. හුඟාක් ඉස්සර කාලේ ඉඳලා පුංචි ළමයි ඒ වගේ සෙල්ලම් කරලා තියෙනවා" ගුරුතුමා කිවුවා.

"සර් පුංචි කාලෙත් ඒ සෙල්ලම කළා ද?" පවනි ඇහුවා.

"ඔව් ඔව්. අතුරු මිතුරු දඹදිව තුරු, ආටක නාටක වේපට සුංගං, වගේ තවත් සෙල්ලම් හුඟාක් මමත් පුංචි කාලේ කරලා තියෙනවා" ගුරුතුමා කිවුවේ හිනා වෙලා.

“අපේ ආච්චි අම්මයි, ආතායි මටත් ඒ සෙල්ලම් කියලා දීලා තියෙනවා.”

“බොහොම හොඳයි මනුක, අලුත් අලුත් දේවල් ඉගෙන ගන්නවා වගේ ම අපේ රටේ පැරණි දේවල් ගැනත් ඉගෙන ගන්න එක හරි ම වැදගත්.

එහෙනම් දරුවනේ අපි ජන ක්‍රීඩා ගැන තවත් දේවල් ඉගෙන ගනිමු.”

ගුරුතුමා පාඩම පටන් ගත්තා.



# 10



# පිංපි බරස් බරස් බරස්

- **අවබෝධය**

පාඩම කියවා උත්තර ලියන්න.

1. අලුත් සෙල්ලමේ නම කුමක් ද?

2. ඒ ක්‍රීඩාව කරන හැටි කියා දුන්නේ කවුද?

3. පොල් ගහ හැදුවේ කොහොම ද?

4. ජන ක්‍රීඩා දෙකක් නම් කරන්න.

## ක්‍රියාකාරකම 2

**පොල් කැඩීමේ ක්‍රීඩාවේ සිදුවීම් අනුපිළිවෙළට අංක යොදන්න.**


| | |
|---|---|
| පොල් කැඩුවා | |
| නැට්ට කැරකෙවුවා | 1 |
| පොල් ගෑවා | |
| පොල් බින්දා | |
| පොල් වතුර බිවුවා | |
| පොල් ලෙලි ගැහුවා | |
| පොල් මිරිකුවා | |



# පිළිතුරු



**Answer**



# 10 පිංපි බරස් බරස් බරස්

- අවබෝධය

පාඩම කියවා උත්තර ලියන්න.

1. අලුත් සෙල්ලමේ නම කුමක් ද?

   පොල් කැඩීම.

2. ඒ ක්‍රීඩාව කරන හැටි කියා දුන්නේ කවුද?

   පවනි සහ මනුක

3. පොල් ගහ හැදුවේ කොහොම ද?

   හැමෝම අත් මිට මොළවා එක උඩ එක තබා

4. ජන ක්‍රීඩා දෙකක් නම් කරන්න.

   අතුරු මිතුරු දඹදිව තුරු

   ආටක නාටක වේපට සුංගං

## ක්‍රියාකාරකම 2

**පොල් කැඩීමේ ක්‍රීඩාවේ සිදුවීම් අනුපිළිවෙළට අංක යොදන්න.**

| | |
|---|---|
| පොල් කැඩුවා | 2 |
| නැට්ට කැරකෙවුවා | 1 |
| පොල් ගෑවා | 6 |
| පොල් බින්දා | 4 |
| පොල් වතුර බිවුවා | 5 |
| පොල් ලෙලි ගැහුවා | 3 |
| පොල් මිරිකුවා | 7 |



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

**Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1**

**එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ**